# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2296/03 - 2022 සැප්තැම්බර් මස 05 වැනි සඳුදා - 2022.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184(1අ) වන වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 184 (1අ) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වත්තල මාබෝල නගර සභාව හා එහි සභාපති වශයෙන් කටයුතු කිරීමේ දී ඉහත කී නගර සභා ආඥාපනතේ 184(1) උපවගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදුකර තිබේ ද යන්න පරීක්ෂා කර මාස 3ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2152/14 හා 2019 දෙසැම්බර් මස 03 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ සභාවෙහි පරීක්ෂණ කාලය 2022 දෙසැම්බර් මස 03 වැනි දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී
එෆ්අයිඑම්(ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝර්ස්
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 5954 — 11 (2022/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*